**පාරිසරික මිතුරු සහන අරමුදල් ව්‍යාපෘතියේ II (රී - ෆෙන්ඩ්ස් II ) 2010**

**---------------------------------------------------------------------------**

**1. මතය**

**--------**

**මාගේ පරික්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 03 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර , මාගේ මතය වනුයේ,**

**(අ) 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2010 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,**

**(ආ) 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ යෙන් ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම්, ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,**

**(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,**

**(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව , සහ**

**(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.**

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මූල්‍ය කාර්ය සාධනය**

**මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව , සමාලෝචිත වර්ෂය සඳහා කරන ලද මුළු වියපැහැදම රු.804,191,323 ක් වූ අතර, 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත තත්ත්වය රු.5,591,133,693 ක් විය. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියපැහැදම් හා 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත තත්ත්වය සාරාංශ කර පහත දැක්වේ.**

| සහභාගිත්ව ණය ආයතන (ස. ණ. ආ) | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියපැහැදම් කළ මුදල | | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියපැහැදම |
|---|---|---|---|
| | 2010 | 2009 | |
| | රු. | රු. | රු. |
| කොමර්ෂල් බැංකුව | 226,434,939 | 399,144,726 | 1,604,063,790 |
| ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව | 284,317,156 | 301,366,249 | 1,379,484,950 |
| ජාතික සංවර්ධන බැංකුව | 12,399,999 | 148,318,663 | 711,236,508 |
| සම්පත් බැංකුව | 30,349,996 | 142,730,415 | 507,482,140 |
| ලංකා බැංකුව | 22,465,797 | 274,740,509 | 484,900,718 |
| හැටන් නැෂනල් බැංකුව | 91,939,893 | 107,043,414 | 391,201,770 |
| ලංකා ඔරික්ස් ලීසින් පීඑල්සී සමාගම | 69,126,652 | 153,430,121 | 286,988,108 |
| පීපල්ස් ලීසින් පීඑල්සී සමාගම | 67,156,891 | 144,297,307 | 225,775,709 |
| එකතුව | 804,191,323 | 1,671,071,404 | 5,591,133,693 |

**2.2 විශේෂ ( යෙන් ) ගිණුම**

--------------------------

**(අ)** **මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකිවූ තොරතුරු අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ (යෙන් ) ගිණුමේ මෙහෙයුම් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.**

| | 2010 | | 2009 | |
|---|---|---|---|---|
| | ජපන් යෙන් | ශ්‍රී.ලං.රු. | ජපන් යෙන් | ශ්‍රී.ලං.රු. |
| ජනවාරි 01 දිනට ශේෂය | 235,445,459 | 292,258,448 | 636,699,888 | 797,402,940 |
| එකතුකළා :- | | | | |
| වර්ෂය තුළ ඌන පූර්ණයන් | 424,770,329 | 534,477,378 | 940,184,955 | 1,163,494,064 |
| විදේශ විනිමය වාසිය | - | 8,842,814 | - | 2,432,848 |
| | 660,215,788 | 835,578,640 | 1,576,884,843 | 1,963,329,852 |
| අඩුකළා :- | | | | |
| ආපසු ගැනීම් | 637,155,530 | 804,191,323 | 1,341,439,384 | 1,671,071,404 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 23,060,258 | 31,387,317 | 235,445,459 | 292,258,448 |

**(ආ)** **ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වා ගෙන යන විශේෂ ( යෙන් ) ගිණුමේ 2011 දෙසැම්බර් 08 දිනට වූ රු.මිලියන 31.4 කට සමාන ජපන් යෙන් මිලියන 23 ක ශේෂය, කිසිඳු අරමුණු කළ කාර්යයකට යොදා ගැනීමෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි. කෙසේ වුවද, ශ්‍රී ලංකා රජය විසින් එම දිනයේම මෙම ශේෂය මහා භාණ්ඩාගාරයට මාරු කර තිබුණි.**

## 3. විගණන නිරීක්ෂණ

----------------------

## 3.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ)** **තාක්ෂණ සහාය ණය මුදලේ එක් එක් සංරචකය සඳහා උප ණය පිළිබඳ ප්‍රගතිය මූල්‍ය ප්‍රකාශනවල වෙනම හෙළිදරව් කර නොතිබුණි.**

**(ආ)** **සමුච්චිත ණය වියපැහැදම දිස්ත්‍රික් වශයෙන් හා ආංශික වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.**

**3.2** **නොසැසඳු වෙනස්කම්**

**------------------------**

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනට ඊ - ෆ්‍රෙන්ඩ්ස් චක්‍රීය අරමුදල II ගිණුමේ ශේෂය රු.1,923,418,341 ක් වූ අතර ඊට අනුරූපව ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රකාශනයේ දැක්වෙන ශේෂය රු.1,908,910,183 ක් වූයෙන් රු.14,508,158 ක නොසැසඳු වෙනසක් විය.**

**3.3** **විගණනය සඳහා සාක්ෂි නොවීම**

**----------------------------------**

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ)** **සුදුසුකම් නිෂ්කාශනය නිකුත් කිරීම සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සමාලෝචිත වර්ෂය තුළ උප - ණය සඳහා ලබාදුන් අනුමැතිය සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.**

**(ආ)** **උප - ව්‍යාපෘති සඳහා ලැබුණු ණය ඉල්ලුම් පත්‍ර, ඇගයීම් වාර්තා සමඟ ව්‍යාපෘති යෝජනා , ණය අනුමත කිරීමේ ආකෘති පත්‍ර , කාර්තුමය ප්‍රගති වාර්තා ආදිය සම්බන්ධයෙන් අදාළ ලියකියවිලි හා ලිපිගොනු , ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් පවත්වා නොතිබුණි.**

**3.4** **මෙහෙයුම් උපදෙස් හා සාකච්ඡා සටහන් වලට අනුකූල නොවීම**

**------------------------------------------------------------------**

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ)** **ජාත්‍යන්තර සහයෝගිතාවය සඳහා වූ ජපන් බැංකුව (ජාසජබැ) හා ශ්‍රී ලංකා රජය (ශ්‍රීලංර) අතර 2003 දෙසැම්බර් 03 දින ඊ - ෆ්‍රෙන්ඩ්ස් II ව්‍යාපෘතිය පිළිබඳ සාකච්ඡා සටහන් (MOD) වලට අනුව, ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා වූ ජපන් බැංකුවේ දූත මණ්ඩලය හා ශ්‍රී ලංකා රජයේ නිලධාරින් විසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමේ උපලේඛනය හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග තහවුරු කර තිබුණි. කෙසේ වුවද, ලබාගත හැකි වූ තොරතුරු අනුව ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට හා වෙනත් අදාළ නියෝජිතායතනවලට පහත දැක්වෙන තීරණවලට අනුකූල වීමට නොහැකිවී තිබු බව නිරීක්ෂණය විය.**

**(i).** **ව්‍යාපෘති කාර්යයන්වල ප්‍රතිඵලයක් ලෙස අත්කරගත් ප්‍රතිලාභ පිළිබඳ වාර්ෂික බලපෑම් අධ්‍යයනය සිදුකිරීම.**

**(ii).** **ව්‍යාපෘතිය පිළිබඳ මහජනයාට හා අවසාන පාරිභෝගිකයන්ට දැනගැනීම සඳහා අදාළ මහජන සම්බන්ධතා සංවිධාන පැවැත්වීම.**

**(iii)** **ව්‍යාපෘතිය සරලාකාරයෙන් හා ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියළු ක්‍රියාමාර්ග ගැනීම.**

**උදා :- ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ප්‍රධාන තනතුරු ඇතුළත්ව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා යොදා ගැනිම සම්බන්ධයෙන් බොහෝ අඩුපාඩු විගණනයේදී නිරික්ෂණය විය.**

**(iv)** **සහභාගීත්ව ණය ආයතන (ස. ණ. ආ) පිළිබඳ යෝග්‍යතාවය සෑම වර්ෂයකම සමාලෝචනය කිරීම හා සමාලෝචනය පිළිබඳ ප්‍රතිඵල ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා වන ජපන් බැංකුවට වාර්තා කිරීම.**

**(v)** **කර්මාන්ත අංශය , කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සහ පරිසර දූෂණය පාලනය පිළිබඳ ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම සඳහා ප්‍රතිපත්ති සම්බන්ධිකරණ කමිටුවක් ස්ථාපිත කිරීම, සහ ව්‍යාපෘතිය තුළ එම ප්‍රතිපත්තිය විධිමත්ව නිරූපනය වීම සඳහා ව්‍යාපෘතියේ මෙහෙයුම හා ක්‍රියාවලිය සංවිධානය කිරීම.**

(vi) ව්‍යාපෘතිය ඇගයීමේ අරමුණින් දර්ශක අධීක්ෂණය හා විශ්ලේෂණය කිරීම මඟින් ව්‍යාපෘතියට මෙහෙයුම් හා ඵලදායි දර්ශක සකස් කිරීම.

(ආ) ඊ - ෆ්‍රෙන්ඩ්ස් II ව්‍යාපෘතිය පිළිබඳ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ මෙහෙයුම් උපදෙස් අනුව, ඊ - ෆ්‍රෙන්ඩ්ස් II ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබාගත් විට, ජාතික පාරිසරික පනතේ රෙගුලාසි හා ප්‍රමිතින් තහවුරු කිරීමට කර්මාන්ත ව්‍යවසාය ක්‍රියාත්මක කිරීමේ ඊ - ෆ්‍රෙන්ඩ්ස් II ව්‍යාපෘතියට හැකි විය යුතුය. කෙසේ වුවද, විගණනයට ඉදිරිපත් කරන ලද ණය ලිපි ගොනු 42 කට අනුව, එම ණය සඳහා විධිමත් අනුමැතින් ලබාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(i) රු.148,484,279 ක් වූ ණය 18 කට අදාළව මධ්‍යම පරිසර අධිකාරියෙන් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත් බවට සාක්ෂි නොතිබුණි.

(ii) රු.65,780,857 ක් වූ ණය 04 කට අදාළව ව්‍යාපෘති ඇගයීම් වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iii) රු.128,824,283 ක් වූ උප ණය 12 කට අදාළව සහභාගීත්ව ණය ආයතන (අදාළ බැංකු ) විසින් පැවැත්විය යුතු පරීක්ෂණ පිළිබඳ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

3.5 අරමුදල් උපයෝජනය

------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

ණය පරිපාලනය

-------------------

(අ) අනුමත ක්‍රියාපරිපාටිය

-------------------------

ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ජපන් යෙන් මිලියන **5,236** ක් වන අතර **2010** දෙසැම්බර් **31** දක්වා කරන ලද වියපැහැදම ජපන් යෙන් මිලියන **5,166.82** ක් විය. ඒ අනුව, ඉතිරි ශේෂය ජපන් යෙන් මිලියන **69.18** ක් විය. ( රු.මිලියන **92.95**)

**(i)** එවකට ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගෙන් ලද අදහස් දැක්වීම් වලට අනුව, ව්‍යාපෘති අධ්‍යක්ෂගේ පුරප්පාඩු තනතුරේ සියළු කටයුතු ඔහු විසින් ආවරණය කර තිබූ අතර ණය අනුමත කිරීමේ ක්‍රියාවලිය මනාව සංවිධානය කිරීම සඳහා අදාළ ලියකියවිලි හඳුන්වාදීම මඟින් ලේකම් විසින් නිවැරදි කිරීමේ කාර්යයන් කිහිපයක් ගෙන තිබුණි. කෙසේ වුවද, එවැනි පරිපාටියක් විධිමත්ව ක්‍රියාත්මක කර නොතිබූ බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

- සමාලෝචිත වර්ෂය තුළදී මෙම ණය යෝජනා ක්‍රමය යටතේ උප - ව්‍යාපෘති **76** කට අදාළව සහභාගිත්ව ණය ආයතනවලට (ස.ණ.ආ) රු.මිලියන 804.19 ක මුදලක් ( ජපන් යෙන් මිලියන **637.16** ) වියපැහැදම් කර තිබුණි. කෙසේ වුවද, උප - ණය ලිපිගොනු **76** කින් රු.**235,093,714** ක් වූ උප ණය වලට අදාළව ණය ලිපි ගොනු **34** ක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද ණය ලිපිගොනු අනුව, එම ණය සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

- උප ව්‍යාපෘති **76** ක් යටතේ රු.මිලියන 804.19 ක මුදලකට අදාළව, එවකට ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් ණය අනුමත කිරීම සඳහා යොදාගත් ණය අනුමත කිරීමේ ආකෘති විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එසේ වුවද , විගණනයට ඉදිරිපත් කරන ලද උප ව්‍යාපෘති 13 කට අදාළ ණය අනුමත කිරීමේ ආකෘති **06** කින් උප ව්‍යාපෘති **05** ක් සඳහා රු.මිලියන 17.75 ක මුදලකට අදාළව පමණක් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාදී තිබූ නමුත් එම මුදලද ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සමාලෝචිත වර්ෂය තුළදී සහභාගීත්ව ණය ආයතන වෙත වියපැහැදම් කර නොතිබුණි.

**(ආ) වියපැහැදම් ක්‍රියාපරිපාටිය**

**-------------------------------**

**මූල්‍ය ප්‍රකාශන වලට හා ලබාගත හැකි වූ තොරතුරු වලට අනුව , සමාලෝචිත වර්ෂය තුළදී දිස්ත්‍රික් වශයෙන් කරන ලද ණය විය පැහැදම් කිරීම පහත දැක්වේ.**

| දිස්ත්‍රික්කය | විය පැහැදම | |
|---|---|---|
| | මුදල | ප්‍රතිශතයක් වශයෙන් |
| | රු. | % |
| කළුතර | 24,055,211 | 2.99 |
| බදුල්ල | 32,950,000 | 4.10 |
| මහනුවර | 95,803,205 | 11.91 |
| කොළඹ | 338,858,707 | 42.14 |
| ගම්පහ | 112,737,900 | 14.02 |
| මාතලේ | 4,125,000 | 0.51 |
| පොළොන්නරුව | 11,800,000 | 1.47 |
| කුරුණෑගල | 21,844,600 | 2.72 |
| අනුරාධපුරය | 37,511,000 | 4.67 |
| කෑගල්ල | 16,955,700 | 2.11 |
| ගාල්ල | 26,500,000 | 3.30 |
| මාතර | 14,500,000 | 1.80 |
| රත්නපුර | 17,000,000 | 2.11 |
| පුත්තලම | 22,550,000 | 2.80 |
| නුවරඑළිය | 17,000,000 | 2.11 |
| අම්පාර | 10,000,000 | 1.24 |
| එකතුව | 804,191,323 | 100 |




**මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(i)** **2010 ජනවාරි 01 සිට 2010 මැයි 01 දක්වා කාල පරිච්ඡේදය තුළ උප ව්‍යාපෘති 76 කට අදාළව කරන ලද මුළු වියපැහැදම් මුදල රු.මිලියන 804.19 ක් වූ අතර ඉන් පසු සමාලෝචිත වර්ෂය තුළ කිසිදු වියපැහැදමක් සිදුකර නොතිබුණි.**

**(ii)** **ණය ගිවිසුමේ 1 උපලේඛනයේ 1 වගන්තිය අනුව, ශ්‍රී ලංකාවේ සෑම තැනකටම උප - ව්‍යාපෘති සඳහා ණය මගින් ප්‍රාග්ධනය සැපයීම ව්‍යාපෘතියේ අරමුණ විය. ණය යෝජනා ක්‍රමය දිස්ත්‍රික් කිහිපයක පමණක් ක්‍රියාත්මක කර තිබුණු බවත් සමාලෝචිත වර්ෂය තුළ වියපැහැදම් කළ ණයවලින් 42.14% ක් කොළඹ දිස්ත්‍රික්කයේ පමණක් ක්‍රියාත්මක කළ උප ව්‍යාපෘති 43 ක් සඳහා පමණක් වියපැහැදම් කර තිබුණු බවත් නිරීක්ෂණය විය.**

(iii) ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය විසින් පිළියෙල කරන ලද සහභාගිත්ව මූල්‍ය ආයතන වල යෝග්‍යතාවය පිළිබඳ කාලීන සමාලෝචන වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවේ 3(7) වගන්තිය ප්‍රකාරව , උප ණය මුල් මුදල හා පොලිය ආපසු ගෙවීම්වලින් ජනනය වන අරමුදල් ශ්‍රී ලංකා රජය විසින් ණය මුල් මුදල හා පොලිය ගෙවීමට යොදා ගත යුතු අතර ඊ -ෆ්‍රෙන්ඩ්ස් චක්‍රීය අරමුදල් ගිණුම II මගින් ව්‍යාපෘතියේ එම අරමුණ, වාර හා කොන්දේසි මත සහභාගිත්ව ණය ආයතනවලට (PCI) ණය දීමටද යොදා ගත යුතුය. කෙසේ වුවද, 2010 දෙසැම්බර් 31 දිනට චක්‍රීය අරමුදල් ගිණුමේ පැවති රු.1,908,910,183 ක් වූ ශේෂය නැවත ණයදීමේ කාර්ය සඳහා යොදා නොගෙන 2011 දෙසැම්බර් 31 වන විටත් නිෂ්කාර්යව තිබුණි.

3.6 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2.2 වගන්තියට අනුව, ව්‍යාපෘති අධ්‍යක්ෂ හා ප්‍රධාන කාර්ය මණ්ඩලයෙන් සමන්විත " ව්‍යාපෘති මධ්‍ය කාර්ය මණ්ඩලය " ලෙස හඳුනාගත් කණ්ඩායමක් ව්‍යාපෘතියේ සරල හා කාලීන ක්‍රියාකාරිත්වය තහවුරු කර ගැනීමට යොදා ගත යුතුය. තවද , ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා වූ ජපන් බැංකුව (ජාසජබැ) හා ශ්‍රී ලංකා රජය ( ශ්‍රීලංර) අතර ඊ -ෆ්‍රෙන්ඩ්ස් II ව්‍යාපෘතිය පිළිබඳ 2003 දෙසැම්බර් 03 දින සාකච්ඡා සටහන් (MOD) වලට අනුව , සාකච්ඡා සටහන්වල 4.1 ඇමුණුමෙහි දැක්වෙන පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සැලසුම් කරන ලද සංවිධාන ව්‍යුහය පිළිබඳව ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා වූ ජපන් බැංකු දූත කණ්ඩායම හා ශ්‍රී ලංකා රජය එකඟවී තිබුණි. කෙසේ වුවද, ලබාගත හැකිවූ තොරතුරු අනුව ඉහත උපදෙස් අනුගමනය නොකළ අවස්ථා කිහිපයක් නිරික්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(අ) 2010 අප්‍රේල් මාසයේදී ඊ - ෆ්‍රෙන්ඩ්ස් II ව්‍යාපෘතිය එවකට ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයෙන් වර්තමානයේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයට

මාරු කර තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘති අධ්‍යක්ෂ සහ ප්‍රධාන කාර්ය මණ්ඩලය ඇතුළත්ව " ව්‍යාපෘති මධ්‍ය කාර්ය මණ්ඩලය" ලෙස හඳුනාගත් කණ්ඩායමක් ව්‍යාපෘතියේ සරල හා කාලීන ක්‍රියාත්මක වීම තහවුරු කර ගැනීම සඳහා මේ වන තෙක් පත් කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතිය, කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයට මාරු කිරීමට පෙර ගිණුම් සහකාර , රියදුරු, දත්ත මෙහෙයුම් නිලධාරි, කාර්යාල සහකාර හා පුහුණුවන්නන් තිදෙනෙකු ඇතුළත් තනතුරු 07 ක් සඳහා අනුමත කාර්ය මණ්ඩල සීමාව ඉක්මවා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගැනීමෙන් තොරව බඳවා ගෙන තිබුණි. තවද ජ්‍යෙෂ්ඨ පාරිසරික නිලධාරි , ව්‍යාපෘති සංවර්ධන නිලධාරි හා සංඛ්‍යාලේඛන / කළමනාකරණ තොරතුරු පද්ධති නිලධාරි වැනි ප්‍රධාන තනතුරු 2010 අප්‍රේල් වන විටත් පත් කර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘතිය, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයට මාරු කිරීමට පෙර ගිණුම් සහකාරවරුන් දෙදෙනෙකු රු.35,000 ක් හා රු.16,500 ක් වූ වෙනස් මාසික වැටුප් පරිමාණයන් මත මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව එවකට පැවති අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට පත් කර තිබුණි. 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ ගිණුම් සහකාර තනතුර කළමනාකරණ මට්ටම යටතේ වර්ග කර නොතිබුණද, 2009 අගෝස්තු දක්වා ඉහත චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව ගිණුම් සහකාරවරයාට රු.35,000 ක මාසික වැටුපක් ගෙවා තිබුණි. ඊට අමතරව, මෙම සේවකයන් දෙදෙනාගෙන් කෙනෙකු කොන්ත්‍රාත් කාලය අවසන්ව විශ්‍රාම ගිය පසු, සේවක සංඛ්‍යාවට ඇතුළත් නොවූ මෙම තනතුර පුරප්පාඩු වූ බව දක්වමින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව වෙනත් පුද්ගලයකු මෙම තනතුර සඳහා බඳවා ගෙන තිබුණි. තවද අංක 33 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 2.2.5(ඇ) වගන්තියට අනුව , ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයෙන් නියෝජිතයන් සහිතව ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිත්වය දැරිය යුතුය. කෙසේ වුවද, ඉල්ලුම් පත්‍ර කැඳවීමෙන් තොරව හා සම්මුඛ පරීක්ෂණයක් හෝ පැවැත්වීමෙන් තොරව ඉහත සඳහන් තනතුර සඳහා පුද්ගලයකු බඳවා ගෙන තිබුණි. තවද විගණනයට ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව , එම තනතුර සඳහා අවශ්‍ය අවම සුදුසුකම්, තනතුර සඳහා බඳවාගත් පුද්ගලයා සතු නොවීය.

**4.** **නොවිසඳුණු කරුණු**

**-----------------------**

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ)** **ව්‍යාපෘතියේ මෙහෙයුම් උපදෙස් අනුව, ඊ - ෆ්‍රෙන්ඩ්ස් II උප ණයක් සඳහා සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර ලියකියවිලි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට ලැබී මාසයක් ඇතුළත ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් යෝග්‍යතා නිෂ්කාශනය (Eligibility Clearance) නිකුත් කළ යුතු අතර සහභාගිත්ව ණය ආයතන විසින් යෝග්‍යතා නිෂ්කාශනය ලැබීම මත ව්‍යාපෘති ඇගයීම සමඟ ඉදිරියට කර ගෙන යා යුතුය. ඒ අනුව, ඊ - ෆ්‍රෙන්ඩ්ස් II උප ණය අනුමැතියට හා වියපැහැදමට පෙර, නිෂ්කාශන වාර්තාව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් නිකුත් කිරීම අවශ්‍ය වේ. කෙසේ වුවද, විගණනයට ලබාගත හැකිවූ තොරතුරු අනුව, ඉහත මෙහෙයුම් උපදෙස් වලට අනුකූල නොවූ පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.**

**(i)** **2009 වර්ෂය සඳහා කරන ලද රු.**1,671,071,404 **ක්වූ මුළු වියපැහැදම්වලින් රු.**1,104,205,499 **ක මුදලක් එනම් 66% ක් යෝග්‍යතා නිෂ්කාශනය නිකුත් කිරීමෙන් තොරව ව්‍යාපෘතිය විසින් වියපැහැදම් කර තිබුණි.**

**(ii)** **යෝග්‍යතා නිෂ්කාශනය නිකුත් කිරීමට පෙර, උප- ව්‍යාපෘති** 10 **කට අදාළ රු.**188,081,250 **ක මුදලක් වියපැහැදම සඳහා අනුමත කර තිබුණි.**

**(iii)** **යෝග්‍යතා නිෂ්කාශනය නිකුත් කරන දිනයේම උප - ව්‍යාපෘති 04 කට අදාළ රු.**32,850,000 **ක මුදලක් අනුමත කර තිබුණි.**

**(iv)** **ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් රු.436,900,000 ක් වියපැහැදම සඳහා අනුමත කර තිබුණු උප ව්‍යාපෘති 15 කට අදාළව ව්‍යාපෘති නිෂ්කාශන මුදල රු.**176,074,286 **ක් වු අතර එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘති නිෂ්කාශන මුදලට වඩා රු.**260,825,714 **ක මුදලක් අනුමත කර තිබුණි.**

(v) උප ව්‍යාපෘති **06** කට අදාළව රු.165,055,517 ක මුදලක් **2009** වර්ෂය තුළදී වියපැහැදම් කර තිබුණු නමුත් , යෝග්‍යතා නිෂ්කාශනය නිකුත් කර තිබුණේ රු.62,660,000 ක් සඳහා පමණි. ඒ අනුව , රු.102,395,517 ක මුදලක් එනම් 163% ක් යෝග්‍යතා නිෂ්කාශනය කරන ලද මුදලට වඩා වියපැහැදම් කර තිබුණු බව නිරික්ෂණය විය.

(ආ) මෙහෙයුම් උපදෙස් අනුව , රී - ෆ්‍රෙන්ඩ්ස් II ව්‍යාපෘතියෙන් එක් සුදුසු කර්මාන්ත ව්‍යවසායකට උපරිම උප - ණය මුදල රු.මිලියන **50** ක් විය යුතුය. කෙසේ වුවද, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ඉහත උපදෙස්වලට පටහැනිව රු.මිලියන 100 ක් වූ උප - ණයක් එක් ව්‍යවසායකට අනුමත කර තිබුණි.

(ඇ) වියපැහැදම් පරිපාටිය

------------------------

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) 2009 වර්ෂයේ අවසාන කාර්තුව තුළ අනුමත කරන ලද උප - ව්‍යාපෘති 178 කට අදාළ රු.මිලියන 2,306.10 ක් වූ ණය මුදල් වලින් උප - ව්‍යාපෘති **64** කට අදාළ රු.මිලියන 1,010.26 ක මුදලක් එනම් අවසන් කාර්තුවේ අනුමත මුදලින් **44%** ක් කොළඹ දිස්ත්‍රික්කයේ පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(ii) 2009 වර්ෂයේ අවසන් කාර්තුව තුළ අනෙක් මුල් කාර්තු 3 සමඟ සැසඳීමේදී ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ණය අනුමත කිරීම් වල අසාමාන්‍ය වැඩිවීමක් තිබුණු බව නිරික්ෂණය විය. තවද, 2009 වර්ෂය තුළදී කරන ලද රු.මිලියන **1,671.1** ක් වූ මුළු වියපැහැදම්වලින්, රු.මිලියන **779.7** ක ක මුදලක් එනම් **47%** ක් **2009** වර්ෂයේ අවසන් කාර්තුව තුළ වියපැහැදම් කර තිබුණි.

(iii) උප - ව්‍යාපෘති අනුමත කළ දිනයේ සිට ණය වියපැහැදම් සඳහා කාල පරිච්ඡේදය සාධාරණ විය යුතු වුවද , වර්ෂ **02** කට වැඩි කාලයක් ණය ප්‍රතිපූර්ණය සඳහා ගෙන තිබීම මෙන්ම ණය අනුමත කිරීමේ දිනයේ සිට ණය වියපැහැදම් සඳහා මාස **01** කට අඩු කාලයක් ගෙන තිබීම වැනි අතාත්වික කාල පරිච්ඡේදයන් වූ

අවස්ථා කිහිපයක් නිරික්ෂණය විය. උදාහරණයක් වශයෙන්, 2009 අවසන් කාර්තුව තුළ අනුමත කරන ලද උප ව්‍යාපෘති 24 ක් සම්බන්ධයෙන් වූ රු.මිලියන 541.8 ක ණය වලින්, රු.මිලියන 466.2 ක් එනම් අනුමත ණය වලින්ල 86% ක් එම උප ව්‍යාපෘති අනුමත කිරීමේ දිනයේ සිට මාස 01 ක කාල පරිච්ඡේදයක් ඇතුළත වියපැහැදම් කර තිබුණි.

(ඇ) ලී කුඩු , ලී පතුරු හා සිහින් ලී කුඩු යොදා ගනිමින් චිප් බෝඩ් නිෂ්පාදනය කිරීම සඳහා චිප් බෝඩ් සෑදීමේ යන්ත්‍ර මිලදී ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘතිය විසින් වියපැහැදම් කරන ලද රු.මිලියන 50 ක උප - ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි පරික්ෂණයට අදාළව පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) 2007 ජනවාරි 18 දින ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් මෙම උප ව්‍යාපෘතිය සඳහා යෝග්‍යතා නිෂ්කාශනය ලබාදී තිබුණද , ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා වූ ජපන් බැංකුව පත් කරන ලද උපදේශක විසින්, එම උප- ව්‍යාපෘතිය ඊ - ෆ්‍රෙන්ඩ්ස් II ව්‍යාපෘතියේ විෂය පථයට නොවැටෙන හෙයින් හා පහත දැක්වෙන හේතුන් නිසා ඔහුගේ 2008 පෙබරවාරි 21 දින වාර්තාවෙන් ඊ - ෆ්‍රෙන්ඩ්ස් II ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රති - මූල්‍යයනය සඳහා නිර්දේශ කර නොතිබුණි.

- චිප් බෝඩ් සාදන යන්ත්‍රය මිලදී ගැනීම එම ණයවල ඇතුළත් කර නොතිබුණි.

- ඉහත සඳහන් කරන ලද යන්ත්‍රය 2005 වර්ෂයේදී සෘජුවම ආනයනය කර වැඩ බිමේ සවිකර නොතිබුණු අතර වෙනත් සමාගමක් විසින් 1990 වර්ෂයේදී ආනයනය කර සවිකර තිබුණි. පසුව වර්තමාන අයිතිකරු විසින් එය භාර ගෙන එම වැඩබිමේම සවිකර තිබුණි.

- ණය උපයෝජනය කර මිලදී ගන්නා ලද බෝඩ් ලැමිනේටින් යන්ත්‍ර , ඊ - ෆ්‍රෙන්ඩ්ස් II ණය පිළිබඳ විෂය පථය තුළට අයත් ලෙස සැලකිය නොහැකිය.

- **ලැමිනේටින් යන්ත්‍රයේ නම් දත්ත තලයක් ඇතුළත්ව නොතිබුණි.**

**කෙසේ වුවද, ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා වූ ජපන් බැංකුවේ උපදේශක වාර්තාව නොසලකා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සමාලෝචිත වර්ෂය තුළදී උප ව්‍යාපෘති සඳහා ණය වියපැහැදම් කර තිබුණි.**

**(ii)** **විගණනයට ලබාගත හැකිවූ තොරතුරු අනුව, අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් සහභාගිත්ව ණය ආයතන වලට ණය විය පැහැදම් කිරීම සඳහා අනුමැතිය ලබාදී නොතිබුණු බව නිරික්ෂණය විය.**

**(iii)** **කර්මාන්ත ශාලාව පිහිටි පරිශ්‍රය පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවට අයත් පරිශ්‍රයක් වුවද, පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව හා එම සමාගම අතර කිසිදු බදු ගිවිසුමකට එළඹ නොතිබුණි.**

**(iv)** **2010 ජුලි මාසයේදී සිදුකරන ලද විගණන පරික්ෂණයට අනුව, අදාළ එම යන්ත්‍ර ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවති බවත්, වැඩකරුවන් සුළු සංඛ්‍යාවක් ( 03 සිට 05) අතින් කෙරෙන නිෂ්පාදනවල නිරතව සිටි බවත් නිරික්ෂණය විය. සමාගමේ කළමනාකරණය සමඟ කරන ලද සාකච්ඡාවේදී අනාවරණය වූ එම යන්ත්‍ර නිෂ්කාර්යව තිබීමට හේතු පහත පරිදි විය.**

- **ක්‍රියාත්මක කිරීම සඳහා රසායන ද්‍රව්‍ය නොමැතිවීම**
- **කාරක ප්‍රාග්ධනය නොමැතිවීම ( මෙහෙයුම් ආරම්භ කිරීමට දළ වශයෙන් රු.මිලියන 15 ක මුදලක් අවශ්‍යව තිබූ බව අනාවරණය විය )**
- **එම යන්ත්‍රවල පාලන පුවරුවේ සමහර කොටස් අස්ථානගතව තිබූ අතර එම කොටස් ආනයනය කිරීමට සිදුවී තිබීම.**

**(v)** **පරිසරය වැඩිදියුණු කිරීම හා පාරිසරික ආරක්ෂණ ප්‍රමිතීන් පවත්වා ගැනීම ව්‍යාපෘතියේ අරමුණු වුවද , ඉහත කී උප ව්‍යාපෘතිය සඳහා පාරිසරික බලපෑම්**

අධ්‍යයනයක් හෝ ශක්‍යතා අධ්‍යයනයක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සිදුකර නොතිබුණි.

**(vi)** ලංකා බැංකු මොරටුව ශාඛාවේ කළමනාකරු සමඟ කරන ලද සාකච්ඡාවේදී පහත සඳහන් කරුණුද නිරීක්ෂණය විය.

- පවතින ණය සඳහා ගෙවිය යුතු පොලී සහ වාරික සමාගම විසින් බැංකුවට නිරවුල් කර නොතිබුණි.

- ඊ - ෆ්‍රෙන්ඩ්ස් - II ණයවලින් මිලදී ගත් යන්ත්‍ර අතුරින් බැංකු ණය සඳහා උකස් කරන ලද එක් යන්ත්‍රයක් සමාගම විසින් බැංකුවේ අනුමැතිය නොමැතිව අපහරණය කර තිබුණි.

**(vii)** ව්‍යාපෘතියේ පරිසර නිලධාරිගේ වාර්තාව පදනම්ව 2009 සැප්තැම්බර් 24 දින විගණනය විසින් සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයේදී එම යන්ත්‍ර වර්ෂ කිහිපයකට පෙර සවි කරන ලද බවත්, සමහර නිෂ්පාදන සඳහා පරීක්ෂා කර තිබුණද එම යන්ත්‍ර දීර්ඝ කාලයක් භාවිතා කර නොතිබූ බවත් අනාවරණය විය.

**(viii)** ඒ අනුව, උප ව්‍යාපෘතිවලට වියපැහැදම් සිදුකිරීමේදී, එම උප ව්‍යාපෘතියෙන් පාරිසරික ආරක්ෂණ ප්‍රමිතීන් සැලසෙන පරිදි පාරිසරික වැඩිදියුණු කිරීම හා එම උප ව්‍යාපෘතියේ හැකියාව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සලකා බලා නොතිබුණ බව නිරීක්ෂණය විය.

**5.** පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

**(අ)** මුදල් කළමනාකරණය

**(ආ) මානව සම්පත් කළමනාකරණය**

**(ඇ) උප ව්‍යාපෘති අධීක්ෂණය හා ඇගයීම**